ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

***

**පුවත්පත් නිවේදනය**

**<u>ඉන්දියාවේ ජාතික ආරක්ෂක විද්‍යාලය සහ ශ්‍රී ලංකා සන්නද්ධ හමුදා අතර 50 වසරක සහයෝගීතාවය සැමරේ</u>**

කොළඹ, ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය විසින් ඉන්දියාවේ ජාතික ආරක්ෂක විද්‍යාලය (NDC) සහ ශ්‍රී ලංකා සන්නද්ධ හමුදා අතර 50 වසරක සහයෝගීතාවය සැමරීම සඳහා සංවිධානය කළ උත්සවයක් 2023 අගෝස්තු 28 වන දින පැවැත්විණ. දෙරට හමුදාවන් අතර සහයෝගීතාවයේ, සහෝදරත්වයේ සහ මිත්‍රත්වයේ දිගුකාලීන බැඳීම් සැමරීම මෙම උත්සවයේ අරමුණ විය. ආරක්ෂක ලේකම් ජෙනාරාල් (විශ්‍රාමික) කමල් ගුණරත්න මහතා මෙම උත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තා වශයන් සහභාගී විය. ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී ලුතිනන් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා මහතා, ත්‍රිවිධ හමුදාපතිවරු, ඉන්දියාවේ ජාතික ආරක්ෂක විද්‍යාලයේ නිලධාරීන් සහ ආරක්ෂක අමාත්‍යාංශයේ නිලධාරීන් රැසක් මෙම අවස්ථාවට සහභාගී වූහ.

2. ජෙනාරාල් (විශ්‍රාමික) කමල් ගුණරත්න මහතා සහ මහ කොමසාරිස් ගෝපාල් බාග්ලේ මහතා ගෞරවනීය අමුත්තා ලෙස සහභාගී වූ අද්මිරාල් (විශ්‍රාමික) ඩී. බී. ගුණසේකර මහතා හට උපහාර පිරිනැමූහ. ඉන්දියාවේ ජාතික ආරක්ෂක විද්‍යාලයේ ප්‍රථම ශ්‍රී ලාංකික නිලධාරියා වන්නේ ඩී. බී. ගුණසේකර මහතා ය. එතුමා අදින් වසර 50කට වඩා වැඩි කාලයකට පෙර එනම් 1972 වසරේදී ජාතික ආරක්ෂක විද්‍යාලයේ ගත කළ කාලය පිළිබඳ අත්දැකීම් බෙදා හදා ගත්තේය.

3. මෙම අවස්ථාවේ අදහස් දක්වමින් මහ කොමසාරිස් ගෝපාල් බාග්ලේ මහතා ඉන්දියාව සිය “අසල්වැසියා ප්‍රථමයෙන්” යන ප්‍රතිපත්තිය අනුව ශ්‍රී ලංකාවේ ධාරිතා ගොඩනැගීමේ ප්‍රයත්නයන්ට කැපවී සිටින බව ප්‍රකාශ කළේය. දෙරට හමුදාවන් අතර පුහුණු නියැළීම් හමුදා සාමාජිකයන් අතර සහෝදරත්වය සහ කාර්ය සහයෝගීතාවය ශක්තිමත් කර ඇති බව ද එය දෙරට අතර සවිමත් බැඳීමේ පදනම වන බව ද එතුමා අවධාරණය කළේය.

4. මේ අතර උත්සව සභාව ඇමතූ ආරක්ෂක ලේකම්තුමා දෙරට අතර විවිධ ක්ෂේත්‍රයන්හි සබඳතා ඉහළ නැංවීමට මහ කොමසාරිස්තුමා ගන්නා උත්සාහය අගය කළේය. ඉන්දියාව ශ්‍රී ලංකා හමුදා සාමාජිකයන්ගේ පුහුණුවීම්වල ශක්තිමත් කුළුණක් වී ඇති බව අවධාරණය කළ එතුමා ඉන්දියාව ශ්‍රී ලංකාවේ මිත්‍රශීලී අසල්වැසියකු වන බව සහ දෙරට අතර ශක්තිමත් සංස්කෘතික, ජනගහනමය සහ චර්යාමය සමානතා පවතින බව සඳහන් කළේය. එසේම,

එතුමා ඉන්දියාව විසින් ශ්‍රී ලංකා හමුදා සාමාජිකයන්ට ලබා දෙන පූර්ණ සහ පුළුල් පුහුණු අවස්ථා සම්බන්ධයෙන් සිය කෘතවේදීත්වය පළ කළේය.

5. මෙම අවස්ථාව සඳහා ඉන්දියාවේ ජාතික ආරක්ෂක විද්‍යාලයේ ආදි ශිෂ්‍යයන් 50කට ආසන්න පිරිසක් සහභාගී වූහ. ඉන්දියාව විසින් විදේශ රටවලට ලබා දෙන ධාරිතා ගොඩනැගීමේ අවස්ථාවන්ගෙන් 10%ක් පමණ ශ්‍රී ලංකා හමුදා සාමාජිකයන්ට ලබා දෙන අතර එය ඉන්දියාව විසින් එක් රටකට ලබා දෙන විශාලතම අවස්ථා ගණන වේ.

***

***කොළඹ***
***2023 අගෝස්තු 29***